# මහාවංසයෙහි පසුබිම

බටහිර ගණිතයෙහි තුල්‍යතා සම්බන්ධ මගින් කෙරෙන්නේ කුලකයක ඇති අවයව තුල්‍යතා පංතිවලට (උපකුලකවලට) බෙදා වෙන්කිරීම ය. තුල්‍යතා පංතියක හෙවත් තුල්‍යතා උපකුලකයක අවයව (සාමාජිකයන්) අතර යම් සම්බන්ධයක් වෙයි. ඒ සම්බන්ධය එක් තුල්‍යතා පංතියක හා වෙනත් තුල්‍යතා පංතියක අවයව අතර නො වෙයි. $l$ නම් සරල රේඛාවකට සමාන්තර සරල රේඛා සියල්ල සරල රේඛා කුලකයෙහි $L$ නම් තුල්‍යතා පංතියක් හෙවත් තුල්‍යතා උපකුලකයක් තනයි. $l$ ට සමාන්තර නොවූ $m$ නම් සරල රේඛාවක් එලෙස ම සරල රේඛා කුලකයෙහි වෙනත් $M$ නම් තුල්‍යතා උපකුලකයක් තනයි. මේ කළහැකි වන්නේ $l$ නම් සරල රේඛාව ඒ සරල රේඛාවට ම සමාන්තර යැයි බටහිර ගණිතයෙහි සැලකෙන බැවිනි.

යම් සම්බන්ධයක් මත පදනම් ව එසේ  කුලකයක අවයව තුල්‍යතා පංතිවලට බෙදා වෙන්කිරීමෙන් පසුව අපට පෙනී යන කරුණක් නම් යම් තුල්‍යතා පංතියක අවයවයක් හා වෙනත් තුල්‍යතා පංතියක අවයවයක් අතර අදාළ සම්බන්ධය නොමැති බව ය. උදාහරණයක් ලෙස ගතහොත් කලින් සඳහන්කරන ලද සරල රේඛා කුලකයෙහි $L$ තුල්‍යතා පංතියෙහි සරල රේඛාවක් $M$ තුල්‍යතා පංතියෙහි සරල රේඛාවකට සමාන්තර නො වෙයි. එසේ සමාන්තර වී නම් ඒ තුල්‍යතා පංති දෙකක් නොව එක තුල්‍යතා පංතියක් විය යුතු ය.

මෙහි දී තේරුම්ගත යුතු ප්‍රධාන කරුණ නම් සරල රේඛා කුලකය සිංහල ගණිතයක එලෙස තුල්‍යතා පංතිවලට බෙදිය නොහැකි බව ය. එයට හේතුව සිංහල ජ්‍යාමිතියක සරල රේඛාවක් එම සරල රේඛාවට ම සමාන්තර වන්නේ යැයි ගත නොහැකි වීම ය. සිංහල ජ්‍යාමිතියක ඕනෑම සරල රේඛාවක් එම සරල රේඛාවට ම සමාන්තර වන්නේ හෝ නොවන්නේ හෝ නොවේ යැයි ගත හැකි ය.

බටහිර දැනුමට අනුව සමාජයෙහි ජීවත්වන පුද්ගලයන් ද තුල්‍යතා පංතිවලට (උපකුලකවලට) බෙදිය හැකි ය. $A$ නම් පුද්ගලයකුගේ නෑදෑයෝ එක තුල්‍යතා පංතියකට අයත් වෙති. එසේ ම $A$ ගේ නෑයකු නොවූ $B$ නම් පුද්ගලයකුගේ නෑදෑයෝ ද තවත් තුල්‍යතා පංතියකට අයත් වෙති. $A$ ගේ තුල්‍යතා පංතියෙහි සමාජිකයෙක් $B$ ගේ තුල්‍යතා පංතියෙහි කිසිම සාමාජිකයකුගේ නෑදෑයෙක් නො වෙයි. එසේ නෑදෑයකු වී නම් ඒ තුල්‍යතා පංති දෙක එකක් බවට පත්වෙයි. සිංහල සමාජයෙහි එලෙස තුල්‍යතා පංතිවලට බෙදිය  නොහැක්කේ නෑදෑයා යන සම්බන්ධය එහි තුල්‍යතා සම්බන්ධයක් නො වීම ය. අපි ඔක්කොම වැසියෝ....... තුන් සිංහලය ම නෑදෑයෝ යනුවෙන් ගැයෙන ගීතයෙහි බොහෝ දෙනා නොදකින අරුතක් වෙයි.

බටහිර ගණිතයෙහි දැක්වෙන තුල්‍යතා පංතිවලට බෙදීම අවසාන විග්‍රහයෙහි දී බටහිර ක්‍රිස්තියානි නූතනත්වයෙහි ඇති වෙන්කිරීම සමග සමපාත වෙයි. අප නිතර සඳහන්කර ඇති කරුණක් නම් ඊනියා පුනරුදයත් සමග මේ වෙන්කිරීම ආරම්භ වූ බව ය. විස්තෘත පවුලෙන් වෙන් වී න්‍යෂ්ටික පවුල තනාගැනීමත් මිනිසුන් එකිනෙකාගෙන් වෙන්වීම හේතුවෙන් බටහිර න්‍යෂ්ටික පවුල ද බිඳී යන දිශාවකට සමාජය විකාශය වීමත් අපට පෙනෙන්නට ඇති කරුණු ය.

කාල් මාක්ස් පඬිවරයා සමජයීය නිෂ්පාදනය මත පදනම් ව සමාජය ධනපති හා කම්කරු යනුවෙන් පංති දෙකකට බෙදීමට පෙළඹුණේත් බටහිර සමාජය එලෙස පංතිවලට බෙදීමට සංස්කෘතිකව ම හුරු වී සිටි බැවින් යැයි සිතිය හැකි ය. එහෙත් මුළු සමාජය ම එලෙස පංති දෙකකට පමණක් බෙදිය නොහැකි බවත් ඉතා විශාල පිරිසක් ඒ පංති දෙකෙන් එකකටවත් අයත් නොවන බවත් මාක්ස් පඬිවරයා ද දැන සිටියේ ය. මේ පංති දෙකට අයත් නොවූවෝ ගොවියන් සුළු ධනේශ්වරයන් ආදී වශයෙන් සලකනු ලැබූහ. පසු කලෙක ලෙනින් මහතා දේශපාලන විප්ලවයක් කෙළේ මේ පංති විග්‍රහය වැරදි බව තේරුම් ගනිමින් ගොවියන් ද කෙසේ හෝ කම්කරුවන්ගේ පංතියට ම එකතුකර ගනිමිනි. එහෙත් ලෙනින් මහතා බිහිකළ සමාජය වුව ද වැඩිකල් නො පැවතුණි.

© Prof. Nalin De Silva

නිෂ්පාදනය මත හෝ වෙනත් කරුණක් හෝ මත පදනම් ව සමාජයක් පංතිවලට බෙදිය නොහැකි බව විවිධ ස්වරූපවල මාක්ස්වාදීන්ට තවම තේරුම්ගැනීමට නොහැකි වී ඇත. සමාජයෙහි ජීවත්වන මිනිසුන් අතර විවිධ සම්බන්ධතා වෙයි. ඇතැම් සම්බන්ධතා ඥාතීත්වය මත ගොඩනැගෙයි. ඇතැම්විට ජනවාර්ගික, ආගමික ආදී වශයෙන් මිනිස්සු සම්බන්ධතා ඇතිකර ගනිති. ඒ සම්බන්ධ අතරින් ඉතාම දුර්වල වනුයේ නිෂ්පාදනය මත ඇතිකරගන්නා සම්බන්ධතා ය. අපි ඥාතීහු වෙමු, එසේත් නැත්නම් අපි සිංහලයෝ වෙමු ආදී වශයෙන් ගතහැකි විඥානයක් හෝ නිෂ්පාදනය මත පදනම් ව ඇති නො වෙයි. අපි කම්කරුවෝ වන්නෙමු යන වශයෙන් හැඟීමක් විඥානයක් කම්කරුවන් අතර ඇති නො වෙයි. ලෙනින්වාදයෙහි කම්කරු පංති විඥානය පිටතින් ගෙන ආ යුතු බව කියැවෙන්නේ අඩුම තරමින් ලෙනින් මහතා ඉවෙන් හෝ ඒ බව දැන සිටි නිසා ය.

අප මේ බෙදා වෙන්කිරීම සාකච්ඡාකිරීමට පෙළඹුණේ මහාවංසය ඉතිහාස පොතක් ද යන්න ගැන අවධානය යොමුකරමින් සිටි අවස්ථාවක ය. මහාවංසයෙහි ඉතිහාසය ඇත. එහෙත් එහි ඇත්තේ ඉතිහාසය පමණක් නො වෙයි. එහි ධර්මය ද ඇත. වෙනත් විස්තර ද ඇත. රුවන්වැලි සෑය පිළිබඳ චෛත්‍ය කර්මාන්ත කටයුතු එහි විස්තර කෙරෙන්නේ සාහිත්‍ය ග්‍රන්ථයක මෙනි. ඒ එසේ වන්නේ ඇයි?

දැනුම එකිනෙකින් වෙන් වූ විෂයවලට බෙදා වෙන්කිරීම බටහිර ක්‍රිස්තියානි නූතනත්වයෙහි අංගයකි. ඒ ඒ අංශවල දැනුම රැස්කිරීමේ දී අපි විවිධ ආකාරයෙන් කටයුතු කරමු. එහෙත් ඉන් කියැවෙන්නේ ඒ ඒ අංශවල දැනුම් එකිනෙකින් වෙන් ව ස්වායත්තව පවතින බව නො වෙයි. භෞතික විද්‍යාවේ ඉතිහාසය ඉගෙන ගන්නා තැනැත්තාට භෞතික විද්‍යාව හා ඉතිහාසය එකිනෙකින් වෙන්කළ හැකි නො වෙයි. භෞතික විද්‍යාවේ ඉතිහාසය නොව භෞතික විද්‍යාව ඉගෙන ගන්නා අයකුට වුව ද එහි ඉතිහාසයෙන් වෙන්විය හැකි නො වේ.

එපමණක් නො වේ. භෞතික විද්‍යාව හැදෑරීමේ දී එයට බලපෑ දර්ශනය සමාජයීය ආකල්ප, තාක්ෂණය ආදිය ද වැදගත් වෙයි. අද භෞතික විද්‍යාඥයන් බොහෝ දෙනකු මේ කිසිවක් නොහදාරණ බව රහසක් නො වෙයි. ඒ බටහිර ක්‍රිස්තියානි නූතනත්වයෙහි අංගයක් වූ වෙන්කිරීම යන්න විවිධ සමාජ ස්ථරවලට කාන්දු වී ඇති බැවිනි. එහෙත් දැනුම එසේ විෂයයනට කඩා වෙන්කිරීමෙන් අවසානයේ දී සිදුවන්නේ අනර්ථයක් බව සාහිත්‍යය හැදෑරීමේ දී අවබෝධ වෙයි. යහමග ගැන සඳහන් නොකර ඊනියා යථාර්ථයක් නිරූපණයකරන සාහිත්‍ය කෘතිවලින් අවසානයේ දී සිදුවන්නේ පාඨකයාට වැරදි පණිවුඩයක් ලබාදීම බව අපි කලින් සඳහන්කෙළෙමු.

බුද්ධ ජනයාගේ පහන් සංවේගය සඳහා ලියැවුණු මහාවංසය රචනාකෙරුණේ බටහිර ක්‍රිස්තියානි නූතනත්වය ඇතිවීමට වසර දහසකට පමණ පෙර ය. එකල ලංකාවේ සිංහල බෞද්ධ සංස්කෘතියෙහි විෂය වෙන්කිරීමක් නො වී ය. අද ද සිංහල බෞද්ධ සංස්කෘතියෙහි විෂය වෙන්කිරීමක් නැත. අපේ ප්‍රවාද යටතේ ලියැවෙන ලිපි එක් විෂයයකට අයත් වූ දෑ නො වෙයි. එක් ලිපියක වුව ද විවිධ විෂය ගැන සඳහන් වෙයි. අපේ මුළු මහත් සමාජයෙහි ම ඒ බෙදා වෙන් නොකිරීම දැකගත හැකිවිය.

මෙරට අතීතයේ දී ස්ථිර හමුදාවක් නො වී ය. අවශ්‍ය අවස්ථාවක දී ගොවියන් හා වෙනත් අය හමුදාව ලෙස යුද පෙරමුණට යැවිණි. ලෝකයේ වෙනත් රටවල ද එවැනි තත්වයක් තිබී ඇත. අද බටහිර උගතුන්ට ඒ තත්වය තේරුම්ගත නොහැකි බැවින් ඔවුහු එවැනි “හමුදාවලට” ගොවි හමුදා (peasant army) යැයි කියති. ඒ ගොවි හමුදාවක් නොව හමුදාවක් වූ ගොවීහු වූහ. අවශ්‍ය අවස්ථාවක දී හමුදාවක් ලෙස කටයුතුකිරීමට ඒ ගොවීන්ට හැකිවුයේ ඔවුන්ට ඒ සඳහා යම් පුහුණුවක් ජීවිතයෙන් ම හෝ වෙනත් අයුරකින් හෝ ලැබී තිබුණු බැවින් ය.

එමෙන් ම මෙරට දැනට අවුරුදු පණහකට පමණ පෙර ජීවත් වූ ගෘහිණීහු අත් වෙදකම් රාශියක් දැන සිටියහ. එසේ ම වෙද මහතා ද ගොවිතැන් කටයුතු කෙළේ ය. මෙයින් කියැවෙන්නේ සිංහල සමාජයෙහි සියල්ලන් සියල්ල දැන සිටි බව නො වෙයි. ඒ ඒ කටයුතු ගැන අනෙක් අයට වඩා දැන සිටි අය වූහ. එහෙත් ඔවුන්ට ද අනෙක් දෑ ගැන යම් අවබෝධයක් තිබූ අතර සාමාන්‍ය ජනයාට ද ජීවිතයට අදාළ කටයුතු ගැන දැනුමක් විය. අද මෙන් විශේෂඥයෝ එකල නො වූහ.

© Prof. Nalin De Silva

මහාවංසයෙහි ඉතිහාසයක් ඇතත් එහි ඉතිහාසය හැරෙන්නට වෙනත් කරුණු ද ඇත්තේ එබැවිනි. ඒ සියල්ලට ම වඩා මහාවංසයෙහි යහමග මේ යැයි පෙන්වා දෙනු ලැබිණි. මහානාම හිමියන් මහාවංසය රචනාකෙළේ සිංහල බෞද්ධ සංස්කෘතියෙහි මිස බටහිර යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතියෙහි නො වෙයි. අද බොහෝ දෙනා මහාවංසය විවේචනය කරන්නේ මේ සංස්කෘතික වෙනස තේරුම් නො ගෙන ය.

මහාවංසය බටහිර ක්‍රිස්තියානි නූතනත්වයෙන් බලා විවේචනය කරන්නෝ එය ඉතිහාස පොතක් නොවේ යැයි කියති. ඒ සැබැවකි. බටහිර යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතිය පැත්තෙන් බැලූ විට එහි ඊනියා ඉතිහාස පොතක් ලිවීමේ දී අනුගමනය කළයුතු “විධික්‍රමය” යොදාගෙන නැත. මහානාම හිමියන් වාස්තවික වී නැති බව ද ඇතැම්හු පවසති. එහෙත් ලෝකයේ කිසිම තැනක වාස්තවික පොත් නැති බව ඔවුහු නො කියති. ඕනෑම පොතක් ලියැවෙන්නේ යම් සංස්කෘතියක් පසුබිම් කරමින් ඒ සංස්කෘතියට සාපේක්ෂව ය. බටහිර ඊනියා වාස්තවික පොත් මෙන් ම ඊනියා යථාර්ථවාදී සාහිත්‍යය ද ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනයෙහි බිහි වූ කෘති ය.

මහාවංසය කියවිය යුත්තේ විෂය එකිනෙකින් වෙන් නොකෙරූ සංස්කෘතියක ජනතාව නිවන් අරමුණු කරගෙන යහමග යැවීමට ලියන ලද කෘතියක් ලෙස සලකමිනි. එහි ඉතිහාසය ඇත. එහෙත් එහි ඇත්තේ ඉතිහාසය පමණක් නො වෙයි. මහාවංසයෙහි එක් අරමුණක් වී ඇත්තේ සිංහල බෞද්ධ රාජ්‍යය තහවුරුකිරීම සඳහා අවශ්‍ය ප්‍රවාද සැපයීම ය. එහෙත් ඒ ප්‍රවාද මහානාම හිමියන්ගේ හිතළු නො වේ. එකල තිබූ එහෙත් අද දක්නට නැති පොත් ද ජනප්‍රවාද ද ඇසුරුකරමින් මහාවංසය ලියැවී ඇත.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva